සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I
தொடர்பாடலும் ஊடகக் கற்கையும் I
Communication and Media Studies I

29 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න**.

**1.** ඇස හා කන අයත්වන සන්නිවේදන මූලිකාංගය වන්නේ,
(1) ග්‍රාහකයායි.
(2) ආකේතකරණයයි.
(3) නාලිකාවයි.
(4) සන්නිවේදකයායි.
(5) විකේතකරණයයි.

**2.** සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයයක් ලෙස ආරම්භ කළ ලොව පළමු විශ්වවිද්‍යාලය වන්නේ,
(1) ඔක්ස්ෆර්ඩ් ය.
(2) ඉලිනොයි ය.
(3) කේම්බ්‍රිජ් ය.
(4) හාවර්ඩ් ය.
(5) සෝබෝන් ය.

**3.** ලංකාවේ පුවත්පත් ඉතිහාසයේ සන්ධිස්ථානයක් ලෙස සැලකෙන 'ලංකාලෝකය' ආරම්භ වන්නේ,
(1) 1802 දී ය. (2) 1834 දී ය. (3) 1860 දී ය. (4) 1862 දී ය. (5) 1866 දී ය.

**4.** පහත වරණ අතුරෙන් යන්ත්‍ර සහායක පුද්ගලාන්තර සන්නිවේදනයට අයත් වන්නේ කුමක් ද?
(1) ගුවන්විදුලිය
(2) ශබ්ද විකාශන යන්ත්‍රය
(3) රූපවාහිනිය
(4) දුරකථනය
(5) ප්‍රක්ෂේපණ යන්ත්‍රය

**5.** සන්නිවේදනය, අඛණ්ඩ ක්‍රියාවලියක් බව සන්නිවේදන ආකෘතිවල දී පැහැදිලි කරන ලද්දේ කවරෙක් ද?
(1) හැරල්ඩ් ඩී. ලැස්වෙල්
(2) ඇරිස්ටෝටල්
(3) වොරන් වීවර්
(4) ක්ලෝඩ් ෂැනන් හා වොරන් වීවර්
(5) විල්බර් ශ්‍රාම් හා චාර්ල්ස් ඔස්ගුඩ්

**6.** කටහඬ, සංගීතය හා නිහඬතාව නිර්මාණාත්මකව යොදා ගන්නා ප්‍රධානතම මාධ්‍යය වන්නේ,
(1) සිනමාවයි.
(2) රූපවාහිනියයි.
(3) ගුවන්විදුලියයි.
(4) සමාජ මාධ්‍යයයි.
(5) ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍යයයි.

**7.** මාධ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේ දී වඩාත් වැදගත් අංගය වන්නේ,
(1) රටෙහි පාලන රාමුවයි.
(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.
(3) ජනමාධ්‍ය අමාත්‍යාංශයයි.
(4) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයයි.
(5) මාධ්‍ය හිමිකාරිත්වයයි.

**8.** ග්‍රාහකයා සක්‍රිය ලෙස අන්තර්ගතය ගොඩනැගීමට දායක වන මාධ්‍ය ක්ෂේත්‍රය තෝරන්න.
(1) මුද්‍රිත මාධ්‍ය
(2) චිත්‍රපට මාධ්‍ය
(3) ගුවන්විදුලි මාධ්‍ය
(4) රූපවාහිනි මාධ්‍ය
(5) සමාජ මාධ්‍ය

[දෙවැනි පිටුව බලන්න

Scanned with CamScanner

9. සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග පමණක් ඇතුළත් නොවන වරණය කුමක් ද?
(1) නාලිකාව, පෙරහනු සහ සන්දර්භය
(2) සන්නිවේදකයා, සන්දර්භය සහ බාධක
(3) බලපෑම, අත්දැකීම් පසුතලය සහ නාලිකාව
(4) සන්දර්භය, ආකේතකරණය සහ ප්‍රතිපෝෂණය
(5) ආකේතකරණය, පණිවිඩය සහ අත්දැකීම් පසුතලය

10. ප්‍රවෘත්තියක නිර්මාණාත්මක භාෂා භාවිතයට වැඩිම ඉඩක් පවතින්නේ,
(1) ආරම්භක ඡේදයේ දී ය. (2) ශීර්ෂ පාඨයේ දී ය.
(3) මූලාශ්‍ර දැක්වීමේ දී ය. (4) සිදුවීම විස්තර කිරීමේ දී ය.
(5) අවසාන ඡේදයේ දී ය.

11. සන්නිවේදන ආකෘතියක දී තොරතුරු මූලාශ්‍රය පිළිබඳ සඳහන් කළේ කවුරුන් ද?
(1) විල්බර් ශ්‍රාම් (2) ඇරිස්ටෝටල්
(3) හැරල්ඩ් ඩී. ලැස්වෙල් (4) ඔස්ගුඩ් හා ශ්‍රාම්
(5) ෂැනන් හා වීවර්

12. භාවිතයේ පහසුව, විශ්වාසය, ගරු කිරීම, පොදු පිළිගැනීම් හා පොදු යහපත දක්නට ලැබෙන්නේ,
(1) ජනසන්නිවේදනයේ ය. (2) සමාජ මාධ්‍ය සන්නිවේදනයේ ය.
(3) විධිමත් සන්නිවේදනයේ ය. (4) මහජන සන්නිවේදනයේ ය.
(5) සාම්ප්‍රදායික සන්නිවේදනයේ ය.

13. වෙනස්වන සමාජ සංස්කෘතික තත්ත්වයන්ට හැඩගැසීම යනු,
(1) සාක්ෂරතාවයයි. (2) සමාජානුයෝජනයයි.
(3) සුපරීක්ෂණයයි. (4) ජනසංස්කෘතියයි.
(5) අපසරණයයි.

14. මාධ්‍ය බාධක උද්ගතවීමට මූලික වශයෙන් බලපාන්නේ,
(1) ග්‍රාහක දුබලතා ය. (2) පාරිසරික දුබලතා ය.
(3) සංඥා දුබලතා ය. (4) ශ්‍රවණ දුබලතා ය.
(5) සන්නිවේදක දුබලතා ය.

15. ප්‍රචාරක මතවාදය ඉදිරිපත් වන්නේ එහි,
(1) දැන්වීම් මගිනි. (2) ප්‍රවෘත්ති මගිනි.
(3) තීරු ලිපි මගිනි. (4) විශේෂාංග ලිපි මගිනි.
(5) සංස්කාරක වැකිය මගිනි.

16. විශාල ග්‍රාහක ක්ෂේත්‍ර සාපේක්ෂ වශයෙන් කුඩා ඉලක්ක කණ්ඩායම් ලෙස බෙදී යන්නේ,
(1) මාධ්‍ය අභිසාරිතාවේ දී ය. (2) නිර්මහාපරිමාණකරණයේ දී ය.
(3) නිර්නියාමනයේ දී ය. (4) පරිභෝජ්‍යකරණයේ දී ය.
(5) ස්වයං නිර්ණයේ දී ය.

17. මූලික අංගයක් ලෙස සම්ප්‍රේෂකය ඇතුළත් වන්නේ,
(1) ඇරිස්ටෝටල් ආකෘතියේ ය. (2) ලැස්වෙල් ආකෘතියේ ය.
(3) ෂැනන්-වීවර් ආකෘතියේ ය. (4) ශ්‍රාම්-ඔස්ගුඩ් ආකෘතියේ ය.
(5) HUB ආකෘතියේ ය.

18. දරිද්‍රතාවට විසඳුමක් ලෙස ධනේශ්වර සාරධර්ම ව්‍යාප්ත කිරීමටත්, කොමියුනිස්ට්වාදයේ ව්‍යාප්තිය අවම කිරීමටත් යෝජනා කරන ලද්දේ,
(1) නවීකරණ න්‍යාය මගිනි. (2) පරායත්ත න්‍යාය මගිනි.
(3) යුනෙස්කෝ සංවිධානය මගිනි. (4) ඩඩ්ලි සියර්ස් විසිනි.
(5) එවරට් එම්. රොජර්ස් විසිනි.

19. "අදෘශ්‍යමාන පිරිසකට කිසියම් මාධ්‍යයකින් අමතන්නේ නම් එය ජනමාධ්‍ය වේ." මෙම නිර්වචනය දැක්වෙන්නේ,
(1) සුමංගල ශබ්දකෝෂයෙහි ය. (2) HUB ආකෘතියේ දී ය.
(3) මැක්බ්‍රයිඩ් වාර්තාවෙහි ය. (4) ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයෙහි ය.
(5) එඩ්වඩ් සැපීර්ගේ නිර්වචනයෙහි ය.

[තුන්වැනි පිටුව බලන්න

Past Papers Wiki
Scanned with CamScanner

20. සන්නිවේදනය සහ සමාජ ව්‍යුහය අතර සම්බන්ධතා වැඩි දියුණු කිරීම සංවර්ධන සන්නිවේදනයේ දී වැදගත්වන බව පෙන්වා දෙන ලද්දේ කවුද?
(1) ශ්‍රීනිවාස් මෙල්කොටේ
(2) සිල්වියෝ වයිස්බෝඩ්
(3) ඩඩ්ලි සියර්ස්
(4) එඩ්ගා ඕවන්ස්
(5) එවරට් එම්. රොජර්ස්

21. අතීත ඥානය ස්මරණය හා සංරක්ෂණය සඳහා පුරාතන පඬිවරු භාවිත කළ සන්නිවේදන උපක්‍රමය වන්නේ,
(1) සාරාංශකරණයයි.
(2) කාණ්ඩකරණයයි.
(3) නිර්මාණකරණයයි.
(4) සිතුවම්කරණයයි.
(5) සංශ්ලේෂණයයි.

22. 'ජාතික සංවර්ධනය' යන්නෙන් මූලික වශයෙන් අදහස් කරනු ලැබුවේ,
(1) දුප්පත්කම, අසමානතාව හා විරැකියාව අඩු කිරීමයි.
(2) සමාජ, සංස්කෘතික, සදාචාරාත්මක හා ආර්ථික සංවර්ධනයයි.
(3) මානසික, අධ්‍යාත්මික හා ද්‍රව්‍යමය අවශ්‍යතා තෘප්තිමත් කිරීමයි.
(4) බටහිර විද්වතුන් පිළිගත් ඉහළ සිට පහළට වූ ධුරාවලිය ක්‍රියාත්මක කිරීමයි.
(5) ඒක පුද්ගල ආදායම, ජාතික ආදායම හා ආර්ථික සුබසාධනයේ ධනාත්මක වර්ධනයයි.

23. මාධ්‍ය නියාමනය පිළිබඳ කරුණු කිහිපයක් පහත දැක්වේ.
A - ශාස්ත්‍රාලීය පර්යේෂකයන්ගේ සහභාගීත්වය
B - නීතිය මගින් ස්ථාපනය වීම
C - දේශපාලන බලපෑම්වලට හසුවීමේ හැකියාව
මෙම කරුණු අදාළ වන නියාමන ප්‍රවේශය වන්නේ,
(1) ස්වයං නියාමනයයි.
(2) ව්‍යවස්ථාපිත නියාමනයයි.
(3) සහනියාමනයයි.
(4) නිර්නියාමනයයි.
(5) අභ්‍යන්තරික නියාමනයයි.

24. පුද්ගල මනසක තැන්පත් වී ඇති සැකසුණු තොරතුරු කට්ටලය,
(1) ඥාන ව්‍යුහයයි.
(2) ස්වකේන්ද්‍රයයි.
(3) මාධ්‍ය සාක්ෂරතාවයි.
(4) චිත්තවේගී මානයයි.
(5) සන්නිවේදන කුසලතායි.

25. නිමල් සිය මාධ්‍ය අත්දැකීම් ඡායාරූප සමගින් ඩිජිටල් මාධ්‍ය අවකාශයක දිනපොතක් මෙන් ඇතුළත් කර තැබීමට තීරණය කළේ ය. මේ සඳහා වඩාත් සුදුසු මාදිලිය කුමක් ද?
(1) වෙබ් අඩවියක් (Web site)
(2) ගොනු විකාශයක් (Podcast)
(3) බ්ලොග්ස් (Blogs)
(4) ව්ලොග්ස් (Vlogs)
(5) එක්ස්/ට්විටර් ගිණුමක් (X/twitter)

26. සමීක්ෂණයක් සඳහා රැස්කරගන්නා ලද දත්ත සංවිධානාත්මකව, ක්‍රමවත්ව විග්‍රහ කිරීමේ දී වඩාත් වැදගත් වන්නේ කුමක් ද?
(1) විශ්ලේෂණය
(2) සම්මුඛ සාකච්ඡාව
(3) පර්යේෂණ ක්‍රමවේදය
(4) නිගමන ඉදිරිපත් කිරීම
(5) වගු, ප්‍රස්ථාර හා රූපසටහන් භාවිතය

PAST PAPERS WIKI

27. විවිධ සංස්කෘතීන්ට අයත් ආකල්ප හා චර්යාත්මක රටා පිළිබඳ හැදෑරීම,
(1) ජනප්‍රිය සංස්කෘතික අධ්‍යයනයයි.
(2) අන්තර් සංස්කෘතික අධ්‍යයනයයි.
(3) ගෝලීය සංස්කෘතික අධ්‍යයනයයි.
(4) ජන සංස්කෘතික අධ්‍යයනයයි.
(5) සාම්ප්‍රදායික සංස්කෘතික අධ්‍යයනයයි.

28. පොත් ප්‍රකාශකයෙකු රජයේ පාසලක මාධ්‍ය දිනය වෙනුවෙන් අනුග්‍රාහකත්වය සපයා තිබුණි. මෙම අවස්ථාව නියෝජනය කරන මහජන සම්බන්ධතා වර්ගය කුමක් ද?
(1) රාජ්‍ය මහජන සම්බන්ධතා
(2) ආයතනික මහජන සම්බන්ධතා
(3) වෘත්තීය මහජන සම්බන්ධතා
(4) ව්‍යාපාර මහජන සම්බන්ධතා
(5) මාධ්‍ය මහජන සම්බන්ධතා

[හතරවැනි පිටුව බලන්න

Scanned with CamScanner

29. ප්‍රතිභාව,
(1) හැදෑරීමෙන් අත්පත් කරගන්නා කුසලතාවකි.
(2) අන්‍යයන්ගේ අත්දැකීම් ඇසුරින් ගොඩනගන්නකි.
(3) පෙරදිග රසවාදයේ දැක්වෙන උපතින්ම ලැබෙන ශක්තියකි.
(4) මාධ්‍ය හා මාධ්‍ය තාක්ෂණය පිළිබඳ අවබෝධයකි.
(5) ලියනාඩෝ ඩාවින්චි විසින් ඉදිරිපත් කරන ලද නිර්මාණශීලීත්වයේ මූලිකාංගයකි.

30. පර්යේෂණයක දත්ත විශ්ලේෂණයේ දී සංඛ්‍යා දෙකක් අතර සහසම්බන්ධතාව දැක්වීම හඳුන්වන යෙදුම කුමක් ද?
(1) මාතය (Mode)
(2) මධ්‍යස්ථය (Median)
(3) මධ්‍යන්‍යය (Mean)
(4) ප්‍රතිශතය (Percentage)
(5) අනුපාතය (Ratio)

31. මහජන සම්බන්ධතා හා දැන්වීම්කරණයේ ප්‍රධාන සමානකම වන්නේ,
(1) අවිධිමත් සන්නිවේදනයක් වීමයි.
(2) කළමනාකරණ කාර්යයක් වීමයි.
(3) අලෙවිකරණ මාදිලියක් වීමයි.
(4) පෙළඹවීම් ක්‍රියාවලියක් වීමයි.
(5) පුද්ගලාන්තර සම්බන්ධතාවක් වීමයි.

32. විචාරශීලී ග්‍රාහකයකු සතු ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?
(1) නිසඟයෙන් ලැබෙන ශක්තිය
(2) තොරතුරු මූලාශ්‍ර විමසා බැලීම
(3) සංදේශ ඒ ආකාරයෙන් භාර නොගැනීම
(4) මාධ්‍ය සාක්ෂරතාවයෙන් යුක්ත වීම
(5) මාධ්‍ය මායාව තේරුම් ගැනීම

33. චිත්‍ර ශිල්පය, සාහිත්‍ය සහ සංගීතය යන ක්ෂේත්‍රවලට සම්බන්ධ නිර්මාණකරුවන් වන්නේ, පිළිවෙළින්
(1) ඩාවින්චි, බීතෝවන් සහ ටෝල්ස්ටෝයි ය.
(2) ටෝල්ස්ටෝයි, ශේක්ෂ්පියර් සහ බීතෝවන් ය.
(3) බීතෝවන්, ඩාවින්චි සහ ශේක්ෂ්පියර් ය.
(4) ශේක්ෂ්පියර්, ටෝල්ස්ටෝයි සහ ඩාවින්චි ය.
(5) ඩාවින්චි, ශේක්ෂ්පියර් සහ බීතෝවන් ය.

34. මාධ්‍ය ආයතනයක් වෙනුවෙන් ඔම්බුඩ්ස්මන්වරයෙක් පත්කර ගනු ලබන්නේ,
(1) සහනියාමනයේ දී ය.
(2) අභ්‍යන්තරික නියාමනයේ දී ය.
(3) නිර්නියාමනයේ දී ය.
(4) ව්‍යවස්ථාපිත නියාමනයේ දී ය.
(5) ස්වයං නියාමනයේ දී ය.

35. විද්‍යුත් මාධ්‍ය මගින් ග්‍රාහකයා වෙත තොරතුරු ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය මූලික වශයෙන්,
(1) නියාමනය වූවකි.
(2) නිර්මාණශීලී වූවකි.
(3) ගවේෂණාත්මක වූවකි.
(4) විචාරාත්මක වූවකි.
(5) සම්ප්‍රේෂණාත්මක වූවකි.

36. ජනමාධ්‍ය සංදේශයක් අවබෝධ කරගැනීම, පිළිගැනීම, ප්‍රතික්ෂේප කිරීම හෝ මතක තබාගැනීම සඳහා ග්‍රාහකයාට හැකියාව ලැබෙන්නේ,
(1) නියාමකයන් නිසා ය.
(2) දොරටුපාලකයන් නිසා ය.
(3) පෙරහනු නිසා ය.
(4) ප්‍රතිපෝෂණය නිසා ය.
(5) මාධ්‍ය විස්තාරණය නිසා ය.

37. 'ප්‍රකාශන නිදහස' පිළිබඳ සංකල්පය මුල්වරට විධිමත් ලෙස ඉදිරිපත් වූයේ,
(1) මැක්බ්‍රයිඩ් වාර්තාව මගිනි.
(2) යුනෙස්කෝ සංවිධානය මගිනි.
(3) පෙඩරල් සන්නිවේදන කොමිසම මගිනි.
(4) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය මගිනි.
(5) සංවර්ධනය සඳහා සන්නිවේදනය පිළිබඳ රෝම සම්මුතිය මගිනි.

[පස්වැනි පිටුව බලන්න

Past Papers Wiki
Scanned with CamScanner

38. විචාරශීලී පුද්ගලයෙක් බිහිවීමට මූලික වන්නේ,
(1) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයයි.
(2) අන්තර්පුද්ගල සන්නිවේදනයයි.
(3) සමූහ සන්නිවේදනයයි.
(4) මහජන සන්නිවේදනයයි.
(5) ජනසන්නිවේදනයයි.

39. කමල් රූපවාහිනී මාධ්‍යයේ ප්‍රවෘත්ති ප්‍රකාශය නරඹා තෝරාගත් තොරතුරක් තම පාසලේ මිතුරන්ට ඊට සමාන ලෙසින් ම ඉදිරිපත් කර පෙන්වී ය. මෙම සංසිද්ධිය විස්තර කෙරෙන සන්නිවේදන නිර්වචනය යෝජනා කරන ලද්දේ,
(1) විල්බර් ශ්‍රාම් ය.
(2) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය.
(3) ෂැනන් හා වීවර් ය.
(4) චාර්ල්ස් එච්. කූලි ය.
(5) විමල් දිසානායක ය.

40. පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

A - නොගැඹුරුය, සරලය, මහාපරිමාණිකව නිෂ්පාදනය වේ.
B - උත්තරීතර හා පූජනීය සංකේත පද්ධතියක් මත ගොඩනැගී තිබේ.
C - පුද්ගල අවශ්‍යතා මත තත්වාරෝපණය වෙමින් සමාජානුයෝජනයට උපකාරී වේ.
D - මානව සමාජ පරිණාමයේ ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ පවතින නිර්මාණයකි.
E - උසස් මෙන් ම සදාචාරාත්මක වූ ද බුද්ධිමය වූ ද ශක්‍යතාවලින් සමන්විත ය.

ඉහත ප්‍රකාශ නියෝජනය කරන සංස්කෘතික පද්ධති පිළිවෙලින් සඳහන් වන වරණය තෝරන්න.
(1) ජනප්‍රිය, සාම්ප්‍රදායික, මාධ්‍ය, ගෝලීය, සම්භාව්‍ය
(2) මාධ්‍ය, ජනප්‍රිය, සාම්ප්‍රදායික, ගෝලීය, සම්භාව්‍ය
(3) ගෝලීය, සම්භාව්‍ය, ජනප්‍රිය, සාම්ප්‍රදායික, මාධ්‍ය
(4) සම්භාව්‍ය, ජනප්‍රිය, සාම්ප්‍රදායික, මාධ්‍ය, ගෝලීය
(5) සාම්ප්‍රදායික, මාධ්‍ය, ගෝලීය, සම්භාව්‍ය, ජනප්‍රිය

41. මහජන සම්බන්ධතා වඩාත් වැදගත් වන්නේ,
(1) භාණ්ඩ හා සේවා ප්‍රවර්ධනය කාර්යක්ෂම කිරීමේ දී ය.
(2) ආයතනයේ පිළිගැනීම පළුදු වන ආකාරයේ ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීමේ දී ය.
(3) මාධ්‍ය සම්බන්ධතා ගොඩනගා ගැනීමේ දී හා වෘත්තීයභාවය වැඩිදියුණු කිරීමේ දී ය.
(4) දක්ෂතා, අත්දැකීම් සහිත කාර්යක්ෂම වෘත්තිකයන් ආකර්ෂණය කර ගැනීමේ දී ය.
(5) ගැටලු මැඩපවත්වා ගැනීමේ දී, හොඳ හිත දිනා ගැනීමේ දී මෙන් ම ප්‍රතිරූප නඩත්තු කිරීමේ දී ය.

42. මාධ්‍ය සාක්ෂරතාව ලබා ගැනීමේ දී **අවම** වැදගත්කමක් හිමිවන්නේ,
(1) සෞන්දර්යාත්මක තොරතුරුවලට ය.
(2) ජනවාර්ගික තොරතුරුවලට ය.
(3) චිත්තවේගී තොරතුරුවලට ය.
(4) සංජානන තොරතුරුවලට ය.
(5) සදාචාරාත්මක තොරතුරුවලට ය.

43. තොරතුරු දැනගැනීමේ පනතෙහි මූලික අභිප්‍රාය වන්නේ,
(1) රාජ්‍ය ආයතන සතු තොරතුරු මහජනයාට ලබාගැනීමට ඇති අයිතිය තහවුරු කර දීමයි.
(2) ජනමාධ්‍ය මගින් බාධාවකින් තොරව තොරතුරු ලබාගැනීමට මහජනතාවට ඇති අයිතිය තහවුරු කිරීමයි.
(3) ප්‍රකාශනයේ නිදහස තවදුරටත් තහවුරු කර තොරතුරුවලට ඇති අයිතිය බලගැන්වීමයි.
(4) ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් උද්ගත විය හැකි තත්ත්ව නියාමනයට අවශ්‍ය විධිවිධාන හඳුන්වා දීමයි.
(5) කවර ආයතනයකින් හෝ බාධාවකින් තොරව තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය බලාත්මක කිරීමයි.

44. ශ්‍රව්‍ය-දෘශ්‍ය නිර්මාණයක ආරම්භයේ දී පසුබිම පිළිබඳ ප්‍රේක්ෂකයාට අවබෝධයක් ලබාදීමට භාවිත කරනු ලබන රූපය කුමක් ද?
(1) මධ්‍යම දුර රූපය
(2) දුර රූපය උඩුකුරු දැක්ම
(3) සංස්ථාපන රූපය
(4) දුර රූපය යටිකුරු දැක්ම
(5) මධ්‍යම සමීප රූපය

45. බාධක වර්ගය සහ ඊට අදාළ විස්තරය නිවැරදිව ගැලපෙන වරණය තෝරන්න.

| | | |
|---|---|---|
| (1) පාරිසරික බාධක | - | සමාජ, ආර්ථික, සංස්කෘතික හේතු නිසා හට ගනී. |
| (2) මාධ්‍ය බාධක | - | මාධ්‍ය අන්තර්ගතය හේතුකොට ගෙන ඇති වේ. |
| (3) තාක්ෂණික බාධක | - | මුල් කාලීන යුගවල දක්නට ලැබිණි. |
| (4) අර්ථ බාධක | - | සංදේශ අවබෝධය දුෂ්කර වීමෙන් උද්ගත වේ. |
| (5) මානසික බාධක | - | ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය නිසා වර්ධනය වේ. |

[හයවැනි පිටුව බලන්න

Scanned with CamScanner

**46.** 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතට අදාළ **නොවන** ප්‍රකාශය තෝරන්න.

(1) බුද්ධිමය නිර්මාණ සඳහා ආරක්ෂාව සලසයි.

(2) ප්‍රකාශන හිමිකම ආර්ථික හා සදාචාරාත්මක ලෙස දෙආකාර වේ.

(3) මානව මනසේ නිර්මාණශීලීත්වය මගින් බිහිකරන සමස්තය අදාළ වේ.

(4) ආර්ථික අයිතිවාසිකමේ මුල් අයිතිය කර්තෘත්වයේ ස්වාභාවය මත රඳා පවතී.

(5) නිර්මාණයක් උපුටා දක්වා විවේචනය හෝ විචාරය කිරීමෙන් ප්‍රකාශන අයිතිය උල්ලංඝනය වේ.

**47.** ස්ත්‍රීවාදී විචාරයට පටහැනි තත්ත්වයක් වන්නේ,

(1) කාන්තාවන් ඒකාකෘති ලෙස නිරූපණය කරන බව පෙන්වා දීමයි.

(2) ස්ත්‍රීත්වය පිළිබඳ වටිනාකම් බෙදා හැරීම උදෙසා මාධ්‍ය දායකත්වය ලබා දීමයි.

(3) කාන්තාවන් ලිංගික භාණ්ඩ ලෙස හුවා දැක්වීමට එරෙහි වීමයි.

(4) කාන්තා ගැටලු මාධ්‍ය මගින් විකෘති කිරීම පිළිබඳ සැලකිලිමත් වීමයි.

(5) ස්ත්‍රීන්ගේ වටිනාකම් පිළිබඳ සැලකිලිමත් වීම ප්‍රතික්ෂේප කිරීමයි.

**48.** **සදොස්** ප්‍රකාශය තෝරන්න.

(1) දැන්වීම්කරණය කළමනාකරණ කාර්යයක් ඉටු කරයි.

(2) ජනශ්‍රැතිය යනු පොදු ජනතාවගේ ඥානයයි.

(3) ජනතා කේන්ද්‍රීය ආවරණයට පුද්ගල කේන්ද්‍රීය ආවරණය ඇතුළත් වේ.

(4) ස්වීඩනය විසින් ප්‍රථමවරට තොරතුරු ලබාගැනීමේ නීති සම්මත කරන ලදී.

(5) 1946 දී එක්සත් ජාතීන් තොරතුරු අයිතිය පිළිබඳ යෝජනාව සම්මත කරන ලදී.

**49.** සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.

A - විද්‍යුත් තාක්ෂණය භාවිතය මගින් පුරවැසි දේශපාලන ක්‍රියාකාරීත්වය දියුණු කරයි.

B - ප්‍රජා සහභාගීත්වය වැඩි කරගැනීම සඳහා අත්‍යර්ථ දේශපාලන වේදිකා යොදාගත හැකිය.

ඉහත ප්‍රකාශ අතුරෙන්

(1) A පමණක් නිවැරදි ය. (2) B පමණක් නිවැරදි ය.

(3) A මෙන් ම B ද වැරදි ය. (4) A මගින් B සනාථ කරයි.

(5) B මගින් A සනාථ කරයි.

**50.** පෞද්ගලික රෝහලකට ඇතුළත් කරන ලද රෝගියෙකුට ප්‍රථමාධාර ලබාදීම පමාවීම හේතුවෙන් මියගිය බව මාධ්‍ය වාර්තා කර තිබුණි. මේ සම්බන්ධයෙන් රෝහල් පරිපාලනය ගත් ක්‍රියාමාර්ග කීපයක් පහත දැක්වේ.

A - ජනමාධ්‍ය මගින් විමසන තොරතුරු දුරකථනය මගින් ක්ෂණිකව ලබාදීම

B - මාධ්‍ය නිවේදනයක් නිකුත් කිරීම

C - ජනමාධ්‍ය හමුවක් පවත්වා ප්‍රකාශයක් ලබාදීම

D - 'සුව සරණ' නමින් නොමිලේ එක්දින සෞඛ්‍ය කඳවුරක් පැවැත්වීම

ඉහත ක්‍රියාමාර්ග සඳහා වගකීම පැවරිය හැකි නිලධාරීන් පිළිවෙලින් දැක්වෙන වරණය තෝරන්න.

(1) මාධ්‍ය නිලධාරි, මහජන සම්බන්ධතා නිලධාරි, සිද්ධි කළමනාකරු, මාධ්‍ය ප්‍රකාශක

(2) මහජන සම්බන්ධතා නිලධාරි, මාධ්‍ය නිලධාරි, මාධ්‍ය ප්‍රකාශක, සිද්ධි කළමනාකරු

(3) මාධ්‍ය ප්‍රකාශක, මහජන සම්බන්ධතා නිලධාරි, මාධ්‍ය නිලධාරි, සිද්ධි කළමනාකරු

(4) මාධ්‍ය නිලධාරි, මහජන සම්බන්ධතා නිලධාරි, මාධ්‍ය ප්‍රකාශක, සිද්ධි කළමනාකරු

(5) සිද්ධි කළමනාකරු, මාධ්‍ය නිලධාරි, මාධ්‍ය ප්‍රකාශක, මහජන සම්බන්ධතා නිලධාරි

* * *

Scanned with CamScanner

[සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II
# தொடர்பாடலும் ஊடகக் கற்கையும் II
# Communication & Media Studies II

29 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

※ ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව 40කි.

1. (i) ජනසන්නිවේදනය පිළිබඳ අධ්‍යයනාංශයක් පළමු වරට ආරම්භ කරනු ලැබූ ශ්‍රී ලාංකිය විශ්වවිද්‍යාලය කුමක් ද? (ලකුණු 04)

   (ii) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හැදෑරීමේ අවශ්‍යතාව පිළිබඳ කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 08)

   (iii) සන්නිවේදනයේ ප්‍රධාන කාර්ය **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 12)

   (iv) අන්තර්පුද්ගල සන්නිවේදනය සහ ජනසන්නිවේදනය අතර පවත්නා වෙනස්කම් පහත මූලිකාංග ඇසුරින් සංසන්දනාත්මකව පැහැදිලි කරන්න.
   (අ) සන්නිවේදකයා
   (ආ) ග්‍රාහකයා
   (ඉ) බාධක
   (ඊ) ප්‍රතිපෝෂණය
   (ලකුණු 16)

2. (i) ශ්‍රී ලංකාවේ ජාතික සයිබර් ආරක්ෂණ ආයතනය නම් කරන්න. (ලකුණු 04)

   (ii) මාධ්‍ය මහජන සම්බන්ධතාවෙහි දී භාවිත කරන උපක්‍රම **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

   (iii) භාෂාව නිර්මාණශීලීව භාවිත කිරීමේ වැදගත්කම පහත මාධ්‍ය ඇසුරෙන් පැහැදිලි කරන්න.
   (අ) පුවත්පත්
   (ආ) සිනමාව
   (ලකුණු 12)

   (iv) මාධ්‍ය විකාශයත් සමග විවිධ ප්‍රවණතා ගොඩ නැගෙයි. එබඳු ප්‍රවණතා දෙකක් පහත දැක්වෙයි. උදාහරණ දක්වමින් ඒවා වෙන වෙනම පැහැදිලි කරන්න.
   (අ) නිර්නියාමනය
   (ආ) වාණිජකරණය
   (ලකුණු 16)

3. සන්නිවේදනය සමාජ භූමිකාවක් නිරූපණය කරයි.

   (i) "මාධ්‍යය ම සංදේශය වේ." යන අදහස ප්‍රකාශ කළේ කවුද? (ලකුණු 04)

   (ii) සාම්ප්‍රදායික සන්නිවේදනයේ සුවිශේෂී ලක්ෂණ **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

   (iii) සන්නිවේදනයේ ස්වභාවය හඳුනාගත හැකි ලක්ෂණ තුනක් පහත දැක්වේ. ඒවා කෙටියෙන් වෙන වෙනම විස්තර කරන්න.
   (අ) සන්නිවේදනය ක්‍රියාපටිපාටියකි.
   (ආ) සන්නිවේදනය සංකේතාත්මක ය.
   (ඉ) සන්නිවේදනය අරමුණු සහගත ය.
   (ලකුණු 12)

   (iv) රූපවාහිනී වැඩසටහන් ඇසුරින් පහත සඳහන් කරුණු **දෙක** පිළිබඳ විග්‍රහ කරන්න.
   (අ) ජනප්‍රිය සංස්කෘතික ලක්ෂණ
   (ආ) ගෝලීය සංස්කෘතික ලක්ෂණ
   (ලකුණු 16)

[දෙවැනි පිටුව බලන්න



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
Past Papers Wiki

4. අන්තර්ජාලයේ සැරිසරමින් සිටි රවිහාරිට 'නව මාධ්‍ය ඔස්සේ නව ලොවකට පිවිසෙමු.' මැයෙන් රචනා වූ ලිපියක් කියවීමට අවස්ථාව ලැබුණි.

(i) ලෝක ව්‍යාප්ත ජාලය (WWW) පිළිබඳ අදහස මුල්වරට ඉදිරිපත් කළේ කවුරුන් ද? (ලකුණු 04)

(ii) අනන්‍ය සන්නිවේදනයේ විශේෂතා **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) සමාජ මාධ්‍යයේ යහපත් බලපෑම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) නව මාධ්‍යවල ලක්ෂණ **හතරක්** උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 16)

5. (i) සංස්කෘතිය (Culture) යන යෙදුම මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයන් හි දී පළමුවරට භාවිත කරන ලද විද්‍යාඥයා නම් කරන්න. (ලකුණු 04)

(ii) ගැටුමක් නිරාකරණය කිරීමේ දී සාර්ථක සාකච්ඡාවක වැදගත්කම කරුණු **දෙකක්** ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) සමීක්ෂණයක දී නියැදියක් තෝරාගන්නා විට අවධානය යොමු කළ යුතු කරුණු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) පහත සඳහන් නියාමනයන්ට අදාළ විශේෂ ලක්ෂණ **දෙක** බැගින් නිදසුන් සහිතව වෙන වෙනම පැහැදිලි කරන්න.

(අ) ස්වයං නියාමනය

(ආ) අභ්‍යන්තරික නියාමනය (ලකුණු 16)

6. ජනමාධ්‍ය මගින් ඉදිරිපත් කරන සංදේශ පිළිබඳ ග්‍රාහක විශ්වාසය මැන බැලීමේ සමීක්ෂණයක දත්ත රැස්කිරීමේ කාර්යය සඳහා ඔබ සහභාගී වන්නේ යැයි සිතන්න.

(i) විවිධ තොරතුරු ඇතුළත්, එකට බඳින ලද මුද්‍රිත ප්‍රකාශනය කුමක් ද? (ලකුණු 04)

(ii) පුවත්පත් මාධ්‍යයේ ලක්ෂණ **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) සමීක්ෂණ ක්‍රමය භාවිතයේ දී මුහුණදීමට සිදුවන අවාසි **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) මාධ්‍ය සංදේශයක් විශ්ලේෂණය කිරීම සඳහා යොදා ගන්නා පහත කරුණු පැහැදිලි කරන්න.

(අ) අර්ථය (ආ) පෙළඹවීම

(ඉ) පක්ෂපාතීත්වය (ඊ) විකෘතිකරණය (ලකුණු 16)

7. පාසලේ සංවර්ධන කාර්යයන්ට අවශ්‍ය අරමුදල් රැස්කර ගැනීම සඳහා සිසුන් විසින් ම නිර්මාණය කළ නාට්‍යයක් වේදිකාගත කිරීමට තීරණය කෙරිණි.

(i) ඉඟි, ඉරියව් සහ මුහුණෙන් පළකරන හැඟීම් ඇතුළත් වන සන්නිවේදන ස්වරූපය කුමක් ද? (ලකුණු 04)

(ii) සංවර්ධනයේ දී ප්‍රාදේශීයකරණයෙහි වැදගත්කම කරුණු **දෙකක්** ඔස්සේ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) නිර්මාණකරුවෙකුට අත්දැකීම් ලබාගත හැකි ක්‍රම **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) නාට්‍ය වේදිකාගතකිරීමේ කාර්යයෙහි සිද්ධි කළමනාකරුවෙක් ලෙස ඔබ කටයුතු කරන්නේ නම්, ඔබගේ භූමිකාවට අදාළ කාර්ය **හතරක්** උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 16)

* * *

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library